# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை
# The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

අති විශෙෂ  அதிவிசேஷமானது  **EXTRAORDINARY**

අංක 1067/4 – 1999 පෙබරවාරි 16 වැනි අඟහරුවාද – 1999.02.16

*1067/4 ஆம் இலக்கம் - 1999 ஆம் ஆண்டு பெப்புருவரி மாதம் 16 ஆம் திகதி செவ்வாய்க்கிழமை*

**No. 1067/4 – TUESDAY, FEBRUARY 16, 1999**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)  *(அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது)*  **(Published by Authority)**


# I වැනි කොටස : (I) වැනි ඡේදය — සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. – බී. 4/96.

### 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත

1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61 වන වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියෝග.

මහින්ද රාජපක්ෂ,
ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය.

1999 පෙබරවාරි මස 09 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 1998 'රැකව කලපුව ධීවර කළමනාකරණ ප්‍රදේශ නියෝග' යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝග (මෙහි මින් මතු 'රැකව කලපුව කළමනාකරණ ප්‍රදේශය' යනුවෙන් හඳුන්වනු ලබන) මෙහි උපලේඛනයේ විස්තර කරනු ලබන රැකව කලපුව කළමනාකරණ ප්‍රදේශය සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

3. වෙනත් යම් ලිඛිත නීතියක මීට පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, 1996 නොවැම්බර් මස 7 වැනි දින අංක 948/25 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1996 ධීවර කළමනාකරණ නියෝග හා 1996 ධීවර මෙහෙයුම් නියෝග යටතේ ධීවර මෙහෙයුම් කටයුතුවල යෙදීම සඳහා නිකුත් කරනු ලැබූ යම් බලපත්‍රයක 'රැකව කලපුව කළමනාකරණ ප්‍රදේශය සඳහා වලංගුය' යන කොන්දේසිය පිටසන් කර ඇත්තේ නම් මිස, ඒ බලපත්‍රය රැකව කලපුව ධීවර කළමනාකරණ ප්‍රදේශය ඇතුළත වලංගු නොවිය යුතුය.

4. (1) රැකව කලපුවේ යම් කොටසක ස්ථිර පදිංචිකරුවකු වන තැනැත්තෙකු රැකව කලපුවේ මසුන් ඇල්ලීම කරනු ලැබිය හැකිය.

(2) කිසිම තැනැත්තකු රැකව කලපුවේ මසුන් ඇල්ලීමේ කාර්යය සඳහා –

(අ) විසි දැලක් හෝ පාවෙන දැලක් නොවන වෙනත් දැලක් භාවිතා කිරීම;

(ආ) ජා කොටුවක් නොවන වෙනත් යම් ධීවර ඇටවුමක් ඉදිකිරීම නොකළ යුතුය.

5. ජා කොටුවක් ඉදිකිරීමෙන් රැකව කලපුවේ මසුන් ඇල්ලීමට හිමිකම් ඇති තැනැත්තන්ගේ උපරිම සංඛ්‍යාව විසි පහක් විය යුතුය. එය පහත සඳහන් පරිදි විය යුතුය :–

(1) ඒ එක් එක් තැනැත්තෙකු එක් ජා කොටුවකට වඩා ඉදි නොකළ යුතුය.

(2) ජා කොටු ඉදි කිරීම සඳහා අලුත් තැනැත්තෙකුට ඉඩ නොදිය යුතුය.

(3) ජා කොටුවක් ඉදිකිරීමෙන් වර්ෂ තුනක් ඇතුළත ජා කොටුවක් ඉදි කිරීම සඳහා අවසර පත්‍රයක් ලබා නොගත් තැනැත්තෙකුට අවසර පත්‍රයක් නිකුත් නොකළ යුතුය.

6. (1) පාවෙන දැලක් භාවිතා කිරීමෙන් රැකව කලපුවේ මසුන් ඇල්ලීමට හිමිකම් ඇති තැනැත්තන්ගේ උපරිම සංඛ්‍යාව එක් සියයක් විය යුතුය.

(2) කිසිම තැනැත්තෙකු විසින් කලපුවේ මසුන් ඇල්ලීම සඳහා අඟල් තුනකට (මිලි මීටර් 76) කට වඩා අඩු ඇස් සහිත දැල් හා ඉස්සන් ඇල්ලීම සඳහා අඟල් තුන් කාලකට (මිලි මීටර් 19) කට වඩා අඩු ඇස් සහිත දැල් භාවිතා නොකළ යුතුය. කවර ධීවර මෙහෙයුමකට වුවද භාවිතා කරන දැලක උපරිම දිග අඩි 480 (මීටර් 145) කට වඩා වැඩි නොවිය යුතුය.

7. ජා කොටුවක උපරිම දිග අඩි හැටක් ද (මීටර් දහ අටක්) පළල අඩි විසි හතර (මීටර් හත) ක්ද විය යුතුය. ජා කොටු දෙකක් අතර දුර අඩි හතලිහ (මීටර් දොළහ) කට වඩා අඩු නොවිය යුතුය.

8. (1) කිසිම තැනැත්තෙකු විසින් රැකව කලපුව හරහා ජා කොටු ඉදි නොකළ යුතුය.

(2) ජා කොටු ඉදිකළ යුත්තේ කලපුවේ නොගැඹුරු කොටස්වල එනම්, නෙටොල්පිටිය ගඟේ සිට මුහුදට පිවිසෙන කලපු මෝය දක්වා ප්‍රදේශයේය.

(3) ජා කොටුවක සිට අඩි සියයක් (මීටර් තිහක්) දක්වා වූ ප්‍රදේශය තුළ පාවෙන දැල් භාවිතා නොකළ යුතුය.

9. පාවෙන දැලක් භාවිතා කරන යම් තැනැත්තෙකු විසින් කලපුවේ ගැඹුරු කොටස වන මහඑළිය නමින් හැඳින්වෙන, කලපුවේ මැද කොටසේ එම දැල් එළිම කළ යුතුය.

10. පාවෙන දැල්, විසි දැල් හෝ ජා කොටු භාවිතා කරන කවර හෝ තැනැත්තෙකු විසින් රැකව කලපුවේ එම ධීවර මෙහෙයුම කිරීම සඳහා අවසර පත්‍රයක් තංගල්ල දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති නිලධාරී හෝ සහකාර අධ්‍යක්ෂ (ව්‍යාප්ති) ගෙන් ලබා ගත යුතුය.

11. ඉස්සන් පැටවුන් අලුතින් කලපුවට හඳුන්වා දෙන ලද දින සිට, දන්වනු ලබන දිනය දක්වා, දැල් හා ජා කොටු භාවිතා කිරීම තහනම් කිරීමේ බලය දිස්ත්‍රික් ධීවර ව්‍යාප්ති නිලධාරී හෝ සහකාර අධ්‍යක්ෂ (ව්‍යාප්ති) වෙත පැවරේ.

12. රැකව කලපුව තුළ කිසිදු ආකාරයක යාන්ත්‍රික ධීවර යාත්‍රා මසුන් ඇල්ලීම සඳහා භාවිතා නොකළ යුතුය.

13. කලපුව වටා පිහිටුවනු ලැබූ හෝ පිහිටුවීමට යෝජිත කිසිදු සංවර්ධන ව්‍යාපෘති මඟින් ඉවතලන අපහරණ ද්‍රව්‍ය කලපුවට නොදැමිය යුතුය.

14. මේ නියෝග වල –

'විසි දැල්' යන්නෙන්, අඩි පහළොවේ සිට විස්ස දක්වා (මීටර් 4–6) අර්ධ විෂ්කම්භයකින් යුත් පුළුල් මුව විටක් සහිත වූ, යම් තැනැත්තෙකු විසින් ජලයට විසි කිරීමෙන් නොගැඹුරු ජලයේ ක්‍රියාත්මක කරන්නා වූ කේතු ආකාර දැලක් අදහස් වේ.

'පාවෙන දැල්' යන්නෙන්, කරමලයෙන් හා පැටලැවීමෙන් මසුන් හා ඉස්සන් අල්ලා ගනු ලබන යම් ආයත චතුරශ්‍රාකාර වූ ද දැලක් අදහස් වේ. මේ දැල දියවැල් සමඟ පාවේ.

'ජා කොටුව' යන්නෙන්, මසුන් හා ඉස්සන් ඇල්ලීම පිණිස කලපු ජලාශවල බටපතුරු (උණ බම්බු විශේෂයකි) වලින් හෝ සාමාන්‍යයෙන් කලපුවේ ඉදි කරනු ලබන උගුලකි. මෙය උගුල සහ වැට යන ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත වේ.

### උපලේඛනය

තංගල්ල නගරයේ සිට හම්බන්තොට දෙසට කිලෝ මීටර් 11 පමණ දුරින් පිහිටි රැකව කලපුවේ සියලු ප්‍රදේශ හා කලපුවට සම්බන්ධ සියලුම ග්‍රාම නිලධාරී වසම් වූ රැකව බටහිර, රැකව නැගෙනහිර, මාරකොල්ලිය, මැදගම, වැල්ලඹඩය, මැඩිල්ල සහ නෙටොල්පිටිය මෙයට ඇතුළත් වේ.

03 – 45

---

# பகுதி I: தொகுதி (I) – பொது

## அரசாங்க அறிவித்தல்கள்

ச.வ – பீ 4/96.

**1996 ஆம் ஆண்டின் 2 ஆம் இலக்க கடற்றொழில் நீரியல் வளங்கள் சட்டம்**

1996 ஆம் ஆண்டின் 2 ஆம் இலக்க கடற்றொழில் நீரியல் வளங்கள் சட்டத்தின் 61 ஆவது பிரிவின் கீழ் கடற்றொழில் நீரியல் வளத்துறை அபிவிருத்தி அமைச்சரினால் ஆக்கப்பட்ட ஒழுங்குவிதிகள்.

மகிந்த ராஜபக்ஷ
கடற்றொழில், நீரியல் வளத்துறை,
அபிவிருத்தி அமைச்சர்.

கொழும்பு,
1999 பெப்புருவரி, 9.

ஒழுங்கு விதிகள்

1. இவ் ஒழுங்குவிதி 1998 ஆம் ஆண்டின் ரெக்காவ கடனீரேரி கடற்றொழில் முகாமைத்துவ பிரதேச ஒழுங்குவிதி என எடுத்துக் காட்டப்படும்.

2. இவ் ஒழுங்குவிதி ( இதனகத்துப் பின்னர் ரெக்காவ. கடனீரேரி முகாமைத்துவப் பிரதேசம் எனக் குறிப்பீடு செய்யப்படும்). இதற்கான அட்டவணையில் விபரிக்கப்பட்டுள்ள ரெக்காவ கடனீரேரியின் முகாமைத்துவ பிரதேசத்திற்கு ஏற்புடையதாதல் வேண்டும்.